# නාට්‍ය හා රංගකලාව

## 07 ශ්‍රේණිය - දෙවන වාරය

## දෙවන පාඩම

## පරිසරය

- ජීවී හෝ අජීවී ස්වභාවික වස්තූන් ගේ විවිධ හැඩතල, රටා, වර්ණ හා චලන දැකිය හැකි ය. ස්වභාවික පරිසරයේ යම් රිද්මයක් ග්‍රහනය කර ගැනීමට උත්සහා කරන්න. කාලය අනුව, ස්ථාන අනුව අපට එවැනි තත්ත්වයන් අධ්‍යයනය කළ හැකි ය.

- සෑම ස්වාභාවික වස්තුවකම ඇති චලන සහ රිද්ම රටා නාට්‍ය නිර්මාණය සාර්ථක කර ගැනීම සඳහා දායක කර ගත හැකි ය. එනම්, චලන හා රිද්ම නාට්‍යයක රංගනය සඳහා ප්‍රයෝජනවත් වේ. නාට්‍යයකින් කියැවෙන පරිසරය මැවීමට ස්වාභාවික ලෝකයේ ඇති වස්තූන්ගේ හැඩතල, වර්ණ ද භාවිත කළ හැකි ය.

- සොබා දහම තුළ ද්‍රව්‍ය සම්පිණ්ඩනය වී ඇති ආකාරය ආභාසයට ගනිමින් රංග භූමියේ පසුතල නිර්මාණ සකස් කිරීමට හා නාට්‍යෝපකරණ සකස් කර ගැනීමට උපකාර වේ.

පැවරුම 1: ස්වභාවික පරිසරයේ සිදුවීම් වල චලන රිද්ම රටා හැඩතල වර්ණ හොදින් නිරීන්ෂණය කරන්න

එහි දී පහත අවස්තා ඔබට දැකගත හැකිය

- කළුවැටි අතරින් හිරුපායා ඒම.
- අහසේ පායා ඇති දේදුන්න.
- පොල් රුප්පාවකට සඳ එළිය වැටිම
- මල්, දළු, ඉදුණු, වියලී ගිය ගසක්
- ගල් පරවල හැපී දිය විසුරුවන නදියක්

**අභ්‍යාස**

01. ස්වභාවික පරිසරයේ සංසිද්දියක් පාදක කොට ගනිමින් සිතුවමක් නිර්මාණය කරන්න